# පහන් වැට

## බුදු තෙමගුල සමරමු

බුදු හිමි ලොව පැතිර තිබු
දුරු කරවිය මත අවිදු

තෙමා සිසිලසෙන් මෙදියතෙ
මනුසත දිවි ඇති තුරාම
ගුවන් ගැබෙහි නැගෙයි මහගු
ලකල වෙසක් සඳ මණ්ඩල

සත්වග පිබිදෙන දසදෙස
මහ මඟුලකි පුදන ලොවම
රජිඳුන් සදහම් ආකර
මුනිඳු පාද පත්ම වඳිමු

ජගත් වෙත්තසිංහ
ක්රේගිබරන්

## නේද?

ඔබ සිසිල් සුළඟකිය රුදුරු ගිම්හානයේ
සිසිල් සුව විඳගන්න
මදක් මට ඉඩ දෙන්න
මා නිසා ඔබ සිසිල වියැකේද?
නැහැ නේද?

ඔබ සුනිල් කෙම්බිමය වියලි කාන්තාරයේ
සුවෙන් සැතපී ඉන්න
මදක් මට ඉඩ දෙන්න
මා නිසා ඔබ සෙවන අඩු වේද?
නැහැ නේද?

ඔබ නිමල් සඳ වතය පාළු ආකාසයේ
හද අඳුර දුරලන්න
මදක් මට ඉඩ දෙන්න
මා නිසා සඳ එලිය රළු වේද?
නැහැ නේද?

ඔබේ ලොව මගේ ලොව එකක් නොව
දෙලොවක්ය
එපා ඔබ දුක් වෙන්න
එපා මට දුක් දෙන්න
අද මෙන්ම සිනාසෙමු හෙට දිනද
හා! නේද?

*රසික සූරියආරච්චි*



# කාලි පිල්පිය

වස් කවියක්

යටි මඩි ගහන උන් මහජන පොදු සල්ලි
නැති කර දමන්නට එවනව යක් පිල්ලි
සෙල්ල කතරගම ඇති කෝවිලෙ වල්ලී
සිහිකර පොල් ගසන්නේ අම්මා වල්ලී

දෙවුන්දරට අධිපති යකිණිය කාලී
මම ජප කරන්නේ බන්ධනයට කාලී
අණ කර කියන්නේ යකිණිය තිට කාලී
කුඩු කර පෙන්නපිය මට උන්ගේ කෑලී

**ධර්මවර්ධන රණසිංහ**

## ඔබ සිහිනයක්ද?

ධම්මි විජේසිංහ
කැනඩාව

සඳ පායා දිළෙන රෑ යක
පිණි විසිරෙන සොඳුරු පැයක
සිත අද්දර ගී ගැයූ හැටි
සිහිනයක්ද මට කියන්න..

දෝතට ගෙන නුඹේ මුහුණ
නා දළු දෙතොලත සැංගී
සිප ගත් ඒ මල් මද රෑ ය
යළි ඒ දැයි මට කියන්න

චන්දන සිසිලස විඳ විඳ
කුන්ද සමන් මලක් විළස
දිවියට සෙවණක් වේ මැයි
කී නුඹ මට සිහිනයක්ද.

මියෙන තුරුම නුඹේ හදේ
රැ ඳී ඉන්න පිරූ පෙරුම්
අවපස තරිඳුන් විළසින්
බස යාවිද මට කියන්න

## දුරු රට

නේක කවි පද ගැලු මගෙ සිතට
එකම එක කවක් වත් නොඑන්නට
පලා ගොස් දුරට
දරා ගන්නට බෑ මගෙ සිතට
මේ සීත දුරු රට
වැලපෙනවා තමයි
මමයි මගෙ කවි සිතයි
තනිවෙලා නොරට

තවම හැම හීනෙකම
ඉන්නෙ මම මගෙ රටේ
එරට මා දමා ආ හැම සෙනෙහෙ සිතත්තොම
ඉන්නවා හිත යට
දෙරටකට සිර වෙලා රිදුම් දෙන කඳුල
ගලා යාදෙන් රහසේම යන්ට
මගෙ හිමියනුත් දියණියත් සෙනෙහසින්
ජීවය දෙයි මගෙ හිතට

**චාන්දනී කුලතුංග**
ක්රයිස්ට්චර්ච් නවසීලන්තය

## පිටකොටුව සහ බක් මාසය

හිර වී ඇත කැවුම් සුසුම් ලන
වීදුරු කුඹු තුල කොණ්ඩ පිරිමැද....
එල්ලී තැනින් තැන නිම් ඇඳුම්
නටමින් ගයයි ගී
දූවිලි සුළං සුවඳින් මත් වී....
වාසනා පත් මොර දෙයි
සුරමින් සොටු වාසනාවන්තයින් සොයමින්.....
දහදිය සුවඳ පොරකයි පෝලිමේ
පියාඹන්නට නැකතට පිඹින්නට ගිහි....
කපුටන් කාක් කාක් කියමින්
කොටමින් දුවයි කොවුල් පැටියන්ට....
දුගියන් හිඟමින් ගියයි ගී රස
වයමින් තාලයට බෙලෙක් හඬ....
කිඹුලන් එල්ලී සිටී නුල්වල
ඩුම් ඩුම් හඬින් ගිගුම් දෙන්නට රැය....
දරුවෙක් උරයි කිරි එනතුරු අඬමින්
තිබුණත් දෙතන විටමින් සොයන වැහැරුනු
මව්ගෙන්....

**ලක්ෂ්මන් කොඩිතුවක්කු**

## කෙසේ සමරම්ද මෙදා අවුරුදු..

පාට ගවුම් මල් ඔංචිලි වාරම්
වීදිදු සුරල් පද චන පටස් හඬ
මැදි කොට ඉදිවුණ අවුරුදු සැමරුම්
මෙදා නොමැත මට බොළඳ ළමා විය
මා අතහැර ගොස් ඇති බැවිනි

ගොම පිරිමැදි බිම නැවුම් වළං පොඩි
කැවිලි අවුළු පත් බුලතින් ගනුදෙණු
නුග වියනක් යට හිස තෙල ගෑ දින
සියල්ල සිහිනෙකි එකම අහස යට
දුරු රට තනිවී ඇති බැවිනි

සමගි දමින් බැඳි අතීත යුගයේ
වින්දෙමු අවුරුදු නොමඳ සතුට මැද
හැකි වෙද කිසිලෙස රවටනු අප සිත
කුරිරු යුද්ධයෙන් අපේම මිනිසුන්
අපට අහිමි කර ඇති බැවිනි

**ශ්රියා කුමාරසිංහ**
නවසීලන්තය

## උපරිම පල නෙලති මෙල්බන් පුර වැසියෝ

නීතිවේදී ගල්හේනේ විජේවර්ධන
(ඕස්ට්රේලියාවේ මෙල්බන් නුවර සිට ලියයි..)

විලිකුන් ඇපල් වතුවල ගෙඩි සුවඳ දිදී
මිදිවළු සමග තෙරපී පැනි පෙරෙන ඉදී
චෙරි හා දොඩම් ඉස්ටෝබෙරි අතර වැදී
මිහිරක් මවයි පලතුරු මෙහි තිබෙන හැදී

සමනල පැහැ උරාගෙන අම රස මවන
සනසා මිහිරි සිතුවිලි හදවත නිවන
ඇවිදිනවිට පවා සැනසුම ගෙන දෙවන
සනසයි හිමකිරම සියොළඟ වැද පවන

පිට රටවලින් එන උදවියට නිසි යුරු
නරඹනු පිණිස නගරයෙ තිබෙන විසි තුරු
නොමිලේ ගමන් පහසුව සමග නිර තුරු
උපදෙස් ලැබේ නැත කිසි තැනක හොර බොරු

ගමනා ගමන පොදු යහපත සදන මග
මුත් වැඩිපුර දුවයි තම වාහනයෙ නැග
නීතිය රකින හින්දා අකුරටම අග
පවසති රටේ වැඩි අනතුරු නොවන වග

කොන්දොස්තර කෙනෙකු නැති බස් රතයෙ වැඩ
රියදුරු පමණි කිසි දවසක නොමැත ලෙඩ
මිනිසුන් අවංකව ජාතික හැඟුම උඩ
කිසි දින ගෙවා නැත තඹ දොයිතුවක දඩ

පවතින ඉහළ තැනකම දූමිරිය සේවේ
සිහිලස කළ මැදිරි පිරිසිදුකම කීවේ
පෙන්වන පරිදි සැකසුම තම හැදි යාවේ
සංවර ගති සිරිත් මය ගෙනහැර පෑවේ

වැඩගනු පිණිස දවසේ විසි හතර පැයින්
කටයුතුවල යෙදෙන අව්දිව උදය රැයින්
තත්පරයටම අගයා කර කියන දෙයින්
උපරිම පල නෙලති සැඟවී නොසිට බයින්

වතගොත අනුන්ගේ නොසොයා කිසිම විට
බලමින් තමා දෙස පෙර මග ලකුණු කොට
දියුණුව දකින මෙල්බන් පුර වැසිය නට
ආසිරි පතන දෙවියන් ගැන කියති රට